සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: 2 | පැය / மணித்தியாலம் / Hours: 3යි |

යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා

උපදෙස් :

* මෙම කොටස ප්‍රශ්න **40**කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්න වලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
* කොටස් දෙකට මුළු කාලය **පැය තුනකි**. පිළිතුරු ලියා අවසන් වූ පසු, I **කොටස,** II**කොටසේ** පිළිතුරු පත් සමග **අමුණා** භාර දෙන්න.

## I කොටස

* **1** සිට **10** තෙක් ප්‍රශ්න සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතරින් **එකක්** පමණක් කවර හෝ හේතුවක් මත අනෙක් නම් සමග **නොගැලපේ**. එම **නොගැලපෙන** නම කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1)** 1. ටයිබර් 2. තේම්ස් 3. ටාගුස්
4. විස්ටියුලා 5. ඇල්ප්ස් (.....)

**2)** 1. රෝඩ්ස් 2. සමෝස් 3.සැන්ටෝරිනි
4. ඔලිම්පියා 5. මොල්ඩෝවා (.....)

**3)** 1. කාතේජවරු 2. වෛකිංවරු 3.එටෘස්කන්වරු
4. ඇක්වියන්වරු 5. සැම්නයිට්වරු (.....)

**4)** 1.ජුලියස් 2. ඔක්ටේවියන් 3. නීරෝ
4. තියඩෝසියස් 5. මාර්කස් අවුරේලියස් (.....)

**5)** 1. පස්වන නිකලස් 2. දහවන ලියෝ 3. දෙවන ජුලියස්
4. හයවන ඇලෙක්සැන්ඩර් 5. දෙවන ජුවාම් පාවුළු (.....)

**6)** 1. ජෝර්ජ් වොෂින්ටන් 2. සැමුවෙල් ඇඩම්ස් 3. ජෝන් ජේ
4. රිචඩ් නික්සන් 5. තෝමස් ජෙපර්සන් (.....)

**7)** 1. වෝර්සෝ 2. ඇම්සටර්ඩෑම් 3. ලෙනින්ග්‍රෑඩ්
4. මොස්කව් 5. හෙල්සිංකි (.....)

**8)** 1. සිව්රෙස් 2. ශාන්ත පර්මේන් 3. වර්සායි
4. නියුලි 5. යුට්රෙච්ට් (.....)

**9)** 1. ලොයිඩ් ජෝර්ජ් 2. වුඩ්රෝ විල්සන් 3. ක්ලෙමන්ට්ෂෝ
4. දෙවන විලියම් 5. හැරී ට෴මන් (.....)

**10)** 1. නොබැඳි ජාතීන්ගේ සංවිධාන 2. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල 3.ලෝක බැංකුව
4. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 5. ලෝක සෞඛ්‍ය සංවිධානය (.....)

- අංක 11 සිට **15** තෙක් ප්‍රශ්න වල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැලපේ**. එම **නොගැලපෙන** යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාල **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න

**11)** 1. පෙළපොනීසියානු යුද්ධය - ඇතන්ස් සහ ස්පාටා
2. පියුනික් යුද්ධ - රෝමය සහ කාතේජය
3. සියක් අවුරුදු යුද්ධය - එංගලන්තය සහ ප්‍රංශය
4. හත් අවුරුදු යුද්ධය - ප්‍රංශය සහ ප්‍රශියාව
5. රෝස යුද්ධ - ලැන්කැස්ටර් සහ යෝර්ක් (.....)

**12)** 1. සූවස් ඇල - රතු මුහුද සහ මධ්‍යධරණී මුහුද
2. කීල් ඇල - බෝල්ටික් මුහුද සහ උතුරු මුහුද
3. බොස්පරස් සමුද්‍රසන්ධිය - කළු මුහුද සහ මර්මරා මුහුද
4. පැනමා ඇල - මධ්‍යධරණී මුහුද සහ ඊජියන් මුහුද
5. ඩාඩනලස් සමුද්‍රසන්ධිය - මර්මරා මුහුද සහ ඊජියන් මුහුද (.....)

**13)** 1. ඇමරිගෝ වෙස්පුචි - දේශගවේෂකයෙකි
2. පස්වන චාල්ස් - ශුද්ධ රෝම අධිරාජ්‍යයෙකි
3. රොබට් වෝල්පෝල් - එංගලන්ත අගමැතිවරයෙකි
4. වෝල්ටර් රැලේ - ප්‍රංශ මුහුදු කොල්ලකරුවෙකි
5. වොන් රූන් - ප්‍රශියානු සෙන්පතිවරයෙකි (.....)

**14)** 1. ගිරොන්ඩියන්වරු - ස්පාඤ්ඤය
2. ප්ලේබියන්වරු - රෝමය
3. ජැකොබියන්වරු - ප්‍රංශය
4. මෙන්ෂෙවික්වරු - රුසියාව
5. ඇංග්ලෝ සැක්සන්වරු - එංගලන්තය (.....)

**15)** 1. උත්කෘෂ්ට විප්ලවය - අයිතිවාසිකම් පනත
2. ඇමරිකන් විප්ලවය - නියෝජිතයන් නැත්නම් බදු ද නැත
3. ප්‍රංශ විප්ලවය - නිදහස, සමානාත්මතාවය සහ සහෝදරත්වය
4. බෝල්ෂෙවික් විප්ලවය - සාමය, ඉඩම් සහ පාන්
5. 1848 විප්ලවය - නොනවතින විප්ලවය (.....)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ ප්‍රකාශන/ දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරු වල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම/ ප්‍රකාශන/ දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙලට **නොවේ**. **Y** තීරුව, **X** තීරුව සමග ගැලපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදිය. නිවැරදි සංයෝගයට අදාල **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න

**16)**

| X | Y |
|---|---|
| (i) හෝමර් | A. ඊඩිපස් රෙක්ස්(Oedipus Rex) |
| (ii) සොෆොක්ලීස් | B. ආධ්‍යාත්මික අභ්‍යාස(Spiritual Exercises) |
| (iii) හෙරඩෝටස් | C. ජනරජය(Republic) |
| (iv) ප්ලේටෝ | D. ඔඩෙසි(Odessey) |
| (v) ඉග්නේෂස් ලොයොලා | E. හිස්ටරීස්(Histories) |

1. DECBA 2. BCEAD 3. BEDAC 4. BEACD 5. DAECB (.....)

**17)**

| X | Y |
|---|---|
| (i) බොටිෂෙල්ලි | A. අවසාන විනිශ්චය |
| (ii) ලෙනාර්ඩෝ ඩා වින්සි | B. පස්වන චාල්ස් අධිරාජ්‍යයා |
| (iii) මයිකලාංජිලෝ | C. වීනස්ගේ උපත |
| (iv) ටිටියන් | D. ඇතන්ස්හි පාසල |
| (v) රෆායල් | E. මොනාලිසා |

1. DEABC 2. CEABD 3. BDCAE 4. BEACD 5. CBEDA (.....)

**18)** X Y

(i) තෝමස් හොබ්ස් A. උපයෝගිතාවය

(ii) මොන්ටෙස්ක්‍යු B. තනි රටේ සමාජවාදය

(iii) ජෙරමි බෙන්තම් C. නොනවතින විප්ලවය

(iv) ලියොන් ට්‍රොට්ස්කි D. බලතල බෙදීම

(v) ජෝසප් ස්ටාලින් E. පරමාධිකාරී රාජාණ්ඩුව

1. EDACB 2. CEADB 3. BCEDA 4. BEACD 5. ECDBA (.....)

**19)** X Y

(i) ඔස්ට්‍රියාව A. හොල්ස්ටයින්

(ii) පීඩමොන්ට් B. ලොරේන්

(iii) සැවොයි C. සාර්ඩිනියා

(iv) ෂ්ලෙස්විග් D. හංගේරියාව

(v) ඇල්සාස් E. නිස්

1. DBECA 2. BEDCA 3. DCEAB 4. BCEDA 5. BACDE (.....)

**20)** X Y

(i) ඇයිලාවැපේල් සමුළුව A. 1822

(ii) වෙරෝන් සමුළුව B. 1815

(iii) ට්‍රොපව් සමුළුව C. 1820

(iv) ලයිබැක් සමුළුව D. 1821

(v) වියානා සමුළුව E. 1818

1. BCDEA 2. EACDB 3. BDCAE 4. EDACB 5. BDAEC (.....)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21) ජාතික රාජ්‍යය වල ලක්ෂණ,**

(1) පොදු නීතියක් ක්‍රියාත්මකවීම.

(2) පොදු බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකවීම.

(3) බලය විකේන්ද්‍රගත රාජාණ්ඩුව.

(4) ප්‍රභල ශක්තිමත් මධ්‍යම පන්තිය.

(5) පුද්ගලික හමුදා අහෝසිවීම. (.....)

**22) ඇමරිකන් නිදහස් සටනේ සන්ධිස්ථාන,**

(1) මුද්දර පනත.

(2) ටවුන්සෙන්ඩ් පනත්.

(3) බොස්ටන් තේ සාදය.

(4) මානව හිමිකම් ප්‍රකාශනය.

(5) පැරිස් සාම ගිවිසුම. (.....)

**23) ප්‍රංශ විප්ලවය,**

(1) ප්‍රාග් විප්ලවීය ප්‍රංශ සමාජය ප්‍රජාගණ තුනකට බෙදී පැවතුණි.

(2) මූල්‍ය අර්බුධය ප්‍රංශ විප්ලවය ඇතිවීමට ආසන්නම හේතුව විය.

(3) ප්‍රංශ විප්ලවයේ ආරම්භය සලකුණු කරමින් බැස්ටීලය බිඳහෙලන ලදී.

(4) ප්‍රංශ විප්ලව සමයේ දී 16වන ලුවී රජු ඝාතනය කරන ලදී.

(5) 16වන ලුවී රජු ගෙන් පසු 17වන ලුවී රජු ප්‍රංශ රජු ලෙස ඔටුනු පළඳයි. (.....)

**24)** ජර්මනිය එක්සත් කිරීමේ අවස්ථා,

(1) වියානා සම්මේලනයෙන් ජර්මනිය කොටස් ගණනාවකට බෙදී ගියේය.
(2) 1815-1848 කාලය තුළ ජර්මනිය එක්සත් කිරීමට ප්‍රයත්න කිහිපයක් ගනු ලැබීය.
(3) සොල්වරීන් තීරු බදු සංගමය මගින් ජර්මනිය ආර්ථික වශයෙන් එක්සත්වීම සිදුවිය.
(4) සත්සති යුද්ධයේ සැඩෝවා සටනින් ඔස්ට්‍රියාව පරාජයවීම උතුරු ජර්මානු රාජ්‍ය එකසත් කිරීමට සමත්විය.
(5) 1871 දී ස්පාඤ්ඤය සමග යුද්ධයෙන් ජර්මනිය එක්සත් කිරීම සම්පූර්ණ වේ. (.....)

**25)** දෙවන ලෝක යුද්ධය ඇතිවීමට බලපෑ හේතු,

(1) නැගෙනහිර යුරෝපා ප්‍රදේශ වල ජාතිවාදය වර්ධනයවීම.
(2) ජර්මනිය බලවත්වීම සහ හිට්ලර්ගේ ප්‍රතිපත්ති.
(3) ඉතාලිය බලවත්වීම සහ මුසලෝනිගේ ප්‍රතිපත්ති.
(4) ජපානයේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය.
(5) ජාතීන්ගේ සංගමයේ දුර්වලතා. (.....)

- අංක 26 සිට 30තෙක් එක් එක් ප්‍රශ්නකට දක්වා ඇති (A), (B), (C) සහ (D) වශයෙන් ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා

(A) සහ (B)පමණක් නිවැරදි නම් .......................................... 1 ද
(B) සහ (C) පමණක් නිවැරදි නම් .......................................... 2 ද
(C) සහ (D) පමණක් නිවැරදි නම් .......................................... 3 ද
(A) සහ (C) පමණක් නිවැරදි නම් .......................................... 4 ද
ප්‍රතිචාර **එකක්** හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් ...... **5** ද, ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදිය | (A) සහ (C) පමණක් නිවැරදිය | (B) සහ (C) පමණක් නිවැරදිය | (C) සහ (D) පමණක් නිවැරදිය | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය |

**26)** පහත දැක්වෙන්නන් අතුරෙන් කලීෆා තනතුර දැරුවෝ කවරහුද ?

A. මහම්මත් තුමා
B. ඔත්මාන්
C. අබුබකර්
D. ඇවිසින්නා (.....)

**27)** බ්‍රිතාන්‍යය පාර්ලිමේනුතු ක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?

A. ස්ටුවර්ට් රජවරු පාර්ලිමේන්තුව ශක්තිමත් කළහ.
B. 1832 ප්‍රතිසංස්කරණ පනතින් සාමි මන්ත්‍රී මණ්ඩලයේ බලතල අඩු කෙරුණි.
C. 1928 සර්වජන ඡන්ද බලය හිමිවිය.
D. 19වන සහ 20වන සියවස් වල දී සංවිධානාත්මක පක්ෂ ක්‍රමයක් වර්ධනය විය. (.....)

**28)** පහත දැක්වෙන අය අතුරෙන් සෝවියට් දේශයේ පාලකයෝ කවරහුද?

A. ලියොන් ට්‍රොට්ස්කි
B. බූත්‍රෝස් ගාලි
C. නිකිතා කෘෂෙප්
D. ලියෝනිඩ් බ්‍රෙෂ්නෙෆ් (.....)

**29)** තුෂ්ණී යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?

A. ඇමරිකානු සහ රුසියානු බල කඳවුරු අතර පැවති දෘෂ්ටිවාදීමය, දේශපාලන සහ රාජතාන්ත්‍රික ගැටුමයි.
B. 1949 දී උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය පිහිටුවීම.
C. 1955 දී වෝර්සෝ සම්මුතිය අත්සන් කිරීම.
D. 1989 දී යුද්ධය අවසන් වූවේ යැයි සාමාන්‍යයෙන් සලකනු ලැබේ. (.....)

**30)** එක්සත් ජාතීන්ගේ සංවිධානය විසඳදන ලද අර්බුධ මොනවාද?

A. බර්ලින් අර්බුදය
B. කියුබානු මිසයිල අර්බුදය
C. ගල්ෆ් අර්බුදය
D. ඉන්දු පකිස්ථාන් අර්බුදය (.....)

● පහත **31** සිට **35** දක්වා තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි ඉදිරියේ අංකය **වරහන තුළ** ලියන්න

**31)** මිලාන් ආඥාව ප්‍රකාශයට පත්කළ පාලකයා කවුද?
1. ඔක්ටේවියන් 2. මහා ඇලෙක්සැන්ඩර් 3. කොන්ස්ටන්ටයින්
4.ක්ලෝඩියස් 5. තියඩෝසියස් (.....)

**32)** පාලකයාගේ ආගම ජනතාවගේ ද ආගම වියයුතු බව නියම කළ ගිවිසුම කුමක්ද?
1. විලාෆ්‍රන්කා ගිවිසුම 2. ඔග්ස්බර්ග් ගිවිසුම 3. ප්ලොම්බියර්ස් ගිවිසුම
4. පැරිස් සාම ගිවිසුම 5. ප්‍රාග් ගිවිසුම (.....)

**33)** ප්‍රංශ රෙපරමාදුවාදීන් හැඳින්වීමට භාවිත කළ නම කුමක්ද?
1. හ්‍යුගනෝවරු 2. හසයිට්වරු 3. ලූතර්වාදීන්
4. ප්‍රස්බිටීරියන්වරු 5. ජෙසුයිට්වරු (.....)

**34)** දැනට අක්‍රියව පවතින එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් අනුබද්ධ ආයතනය කුමක්ද?
1. ජාත්‍යන්තර අධිකරණය 2. මහලේකම් කාර්යාලය 3. ආරක්ෂක මණ්ඩලය
4. භාරකාර මණ්ඩලය 5. ආහාර හා කෘෂිකර්ම සංවිධානය (.....)

**35)** නිරවි යුධ සමයේ ඊශ්‍රායයේ ක්‍රියාත්මක වූ රහස් ඔත්තු සේවය කුමක්ද??
1.KGB 2. CIA 3. වෝර්සො 4.මොසාඩ් 5. NATO (.....)

● පහත **36** සිට **40** තෙක් ප්‍රශ්න වලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය **වරහන** තුළ ලියන්න

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | වැරදිය |
| 2 | නිවැරදිය | නිවැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්නන මැනවින් පහදා දෙයි |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36)** | රෝම අධිරාජ්‍යය දේශ සීමාවෙන් ඔබ්බෙහි උතුරු ප්‍රදේශ වල ජීවත් වූ ජර්මන් ගෝත්‍ර ම්ලේච්ඡයන් ලෙස හඳුන්වන ලදී. | බටහිර රෝම අධිරාජ්‍යය බිඳවැටීමට ප්‍රධාන හේතුව ම්ලේච්ඡ ජර්මානු ගෝත්‍රිකයින්ගේ ආක්‍රමණයි. | (.....) |
| **37)** | රෙපරමාදු පාර්ලිමේන්තු සැසිවාර වල දී අටවන හෙන්රි එංගලන්ත සභාවේ උත්තරීතර නායකත්වයට පත්විය. | රෙපරමදු පාර්ලිමේන්තුවේ අවසරය මත අටවන හෙන්රි සිය දික්කසාදය සිදුකරගන්නා ලදී. | (.....) |
| **38)** | 1594 නැන්තටීස් ආඥාව මගින් හත්වන හෙන්රි එංගලන්තය රෙපරමාදුවදීන්ට ආගමික නිදහස ප්‍රදානය කරන ලදී. | ලූතර් සිය ක්‍රිස්තියානි ධර්මයේ සංස්ථා ග්‍රන්ථය මගින් රෙපරමාදුවට අවශ්‍ය සෛද්ධාන්තික පදනම සකස්කරන ලදී. | (.....) |
| **39)** | 1920 දී ලැටරන් ගිවිසුම පාප්වහන්සේ සහ බෙනිටෝ මුසලොනි අතර ඇතිවිය. | බැබිලෝනියානු අත්අඩංගුව සමයේ දී පාප්වහන්සේව රෝමයේ සිරගත කර තිබුණි. | (.....) |
| **40)** | ජෝසප් ස්ටාලින් යුරෝපා රටවල් සමග සාමකාමී සහජීවන ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. | බර්ලින් තාප්පය බිඳහෙලීම නැගෙනහිර සහ බටහිර ජර්මනිය එක්සත්කිරීමට හේතුවිය. | (.....) |

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 13 | විෂයය / பாடம் / Subject ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper 2 | පැය / மணித்தியாலம் / Hours 3යි |

## II කොටස

යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා

උපදෙස් :
* පළමුවන ප්‍රශ්නය(A කොටස) අනිවාර්යය.
* B සහ C කොටස් වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

**(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත )

## A කොටස

**(1)** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලුම ස්ථාන ලකුණු කර නම්කරන්න**.

1. ඩෙන්මාර්කය
2. ලන්ඩන්
3. කෝසිකා
4. ටයිබර් ගඟ
5. වියානා
6. ඩෝවර් සමුද්‍ර සන්ධිය
7. ටාගුස් ගඟ
8. ඇතන්ස්
9. අයෝනියන් මුහුද
10. ඇල්ප්ස් කඳු
11. ස්විට්සර්ලන්තය
12. මර්මරා මුහුද

(නිවැරදිව ලකුණු කිරීමට සහ නම් කිරීමට ලකුණු 01 බැගිනි.)

## B කොටස

**(2)** පුරාණ ග්‍රීකයන්ගේ සංස්කෘතියේ පහත දැක්වෙන අංශ වලින් ඕනෑම **දෙකක** ඔවුන්ගේ කාර්යය සංසිද්ධිය සැකවින් විස්තර කරන්න.
(i) ආගම
(ii) කලාව සහ ගෘහ නිර්මාණ ශිල්පය
(iii) සාහිත්‍යය
(iv) දර්ශනය (ලකුණු 16)

**(3)** "දේශගවේෂණ ව්‍යාපාරය යුරෝපයේ ආර්ථික ක්ෂේත්‍රයේ පමණක් නොව දේශපාලන ක්ෂේත්‍රයේ ද බොහෝ වෙනස්වීම් ඇති කිරීමට සමත්විය"
(i) යුරෝපයේ දේශගවේෂණයට මුල් වූ රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
(ii) මුල් කාලීන දේශගවේෂණයට අනුග්‍රහ දැක් වූ පාලකයන් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 02)
(iii) යුරෝපීය රටවල් සිදුකළ මුල් කාලීන දේශගවේෂණ සැකවින් දක්වන්න. (ලකුණු 05)
(iv) දේශගවේෂණ වලින් උද්ගත වූ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 07)

**(4)** "කාර්මික විප්ලවය දහඅට වන සියවස දෙවන භාගයේ දී සහ දහනවවන සියවස මුල් භාගයේ දී එංගලන්තය තුළ දීර්ඝ කාලීන ආර්ථික, තාක්ෂණික සහ සමාජීය වෙස්කම් රැසක් ඇති කළේය."

(i) "කාර්මික විප්ලවය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) කාර්මික විප්ලවය යුරෝපයේ අන් රට වලට පෙර එංගලන්තයේ ආරම්භවීමට තුඩුදුන් හේතු සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(iii) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 09)

**(5)** පහත මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) රෝම ආගම

(ii) ප්‍රති රෙපරමාදුව

(iii) තිස් අවුරුදු යුද්ධය

(iv) රිචලියු (එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි)

## C කොටස

**(6)** "නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයේ අරමුණු සහ පරමාර්ථ ඉදිරියට ගෙන ගියේ ය. "

(i) නැපෝලියන් බොනපාට් උපන් දිවයින නම් කරන්න. (ලකුණු 01)

(ii) 1796 දී 1797 දී ඔහුගේ නායකත්වය යටතේ ආක්‍රමණය කළ රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02)

(iii) ඔහු ප්‍රංශයේ බලය අත්පත් කරගත් ආකාරය සැකවින් දක්වන්න. (ලකුණු 03)

(iv) නැපෝලියන් ගේ දේශීය ප්‍රතිපත්ති ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 09)

**(7)** ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයෙහි ලා මැසිනි, කැවුර් සහ ගැරිබෝල්ඩි යන නායකයන් ඉටුකළ කාර්යභාරයන් පරීක්ෂා කරන්න. (ලකුණු 16)

**(8)** "යුරෝපය සතුරු බල කඳවුරු දෙකකට බෙදීම පළමු ලෝක යුද්ධය ඇතිවීමට බලපෑ ප්‍රධාන සාධකය විය. "

(i) පළමු ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් ආසන්නම හේතුව කුමක්ද? (ලකුණු 02)

(ii) එකිනෙකට විරුද්ධ බල කඳවුරු දෙකට අයත් රටවල් **දෙක** බැගින් නම් කරන්න. (ලකුණු 02)

(iii) යුරෝපය සතුරු බල කඳවුරු දෙකකට බෙදී ගිය ආකාරය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04)

(iv) යුරෝපය බල කඳවුරු දෙකකට බෙදීම පළමු ලෝක යුද්ධය ඇතිවීමට කොතෙක් දුරට හේතු වී දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 08)

**(9)** පහත මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) 1848 විප්ලව

(ii) බිස්මාර්ක්

(iii) ජාතීන්ගේ සංගමය

(iv) නොබැඳි ජාතීන්ගේ සංගමය (එක් සටහනකට ලකුණු 08 බැගිනි)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!




(8) WWW.PastPapers.WiKi (8)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!